# (උ) මිල හා වැටුප්

## මිල

1966 වර්ෂය තුළ පාරිභෝගික මිල සංචලනය පිළිබඳ විශ්ලේෂණය බොහෝ දුරට පදනම් ව ඇත්තේ සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රසිද්ධ කරන ලද, පාරිභෝගික මිල දර්ශකය මතය. පසුගිය වාර්ෂික වාර්තාවේ මේ පිළිබඳ දුර්වලතාවන් දෙකක් සඳහන් කෙරිණ. එනම් :—

(අ) නගරයේ කම්කරු පන්තියේ පවුල්වල ජීවන වියදමෙහි වෙනස් වීම් මැනීමට සකස් කරන ලද දර්ශකය, මුළු මිලෙහි වෙනස් වීම් විශ්ලේෂණය සඳහා උපයෝගී කර ගැනීම.

(ආ) දර්ශකයේ දැක්වෙන ගණ සඳහා වූ පාරිභෝගික හැඩගැස්ම වෙනස් වී ඇති නමුදු, පසුගිය 16 වර්ෂය තුළ එම දර්ශකය පිළියෙල කිරීමේ දී උපයෝගී කර ගන්නා ලද බර තැබීම් පුනරීක්ෂණය කොට නොමැති වීම.

දර්ශකය විශ්වාසදායී නොවීම සඳහා වූ තවත් සාධකයක් නම් භාණ්ඩයක් පිළිබඳව සැපයුමේ උච්චාවචනයන් හේතු කොට ගෙන විවෘත හා පාලිත වෙළෙඳ පොලවල සාපේක්ෂ වැදගත්කම පිළිබඳව ඇති වූ වෙනස් වීමයි. දර්ශකය යථා තත්වයෙන් පවත්වා ගැනීමට නම්, විවිධ වෙළෙඳ පොළවල භාණ්ඩ මිලෙහි සම්බන්ධතාවය ඇති කිරීම සඳහා බර තැබීම් නිරන්තරයෙන් පුනරීක්ෂණය කළ යුතු වුවද, එවැනි පුනරීක්ෂණයන් සැම විටම කළ හැක්කේ නොවේ.

II (උ) 1 සංඛ්‍යා සටහනෙහි මෙම දර්ශකය හා එහි උප දර්ශකයන් 1957 දී සිට සංචලනය වූ අයුරු දැක්වේ.

### II (උ) 1 සංඛ්‍යා සටහන

### කොළඹ පාරිභෝගික මිල දර්ශකය

**(පදනම – 1952 — 100)**

| වර්ෂය | සියළුම ශීර්ෂ | භාණ්ඩ අනුව | | | | | ගණ අනුව | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | ආහාර | රෙදිපිළි | ඉන්ධන හා එළිය | ගෙවල් කුලී | විවිධ | දේශීය ගණය | ආනයන ගණය | අපනයන ගණය |
| 1957 ... | 102·8 | 104·9 | 84·4 | 97·3 | 101·5 | 106·9 | 104·9 | 98·1 | 126·8 |
| 1958 ... | 105·0 | 105·8 | 87·5 | 101·0 | 101·5 | 113·1 | 109·2 | 97·0 | 135·0 |
| 1959 ... | 105·2 | 104·7 | 92·1 | 102·4 | 101·5 | 115·3 | 108·0 | 97·1 | 153·1 |
| 1960 ... | 103·5 | 100·8 | 95·1 | 102·7 | 101·5 | 117·5 | 108·9 | 93·7 | 138·4 |
| 1961 ... | 104·8 | 99·8 | 103·9 | 104·4 | 101·5 | 122·8 | 112·3 | 94·6 | 119·1 |
| 1962 ... | 106·3 | 100·9 | 108·2 | 105·6 | 101·5 | 124·9 | 113·9 | 96·7 | 113·8 |
| 1963 ... | 108·8 | 103·0 | 118·2 | 103·0 | 101·5 | 126·6 | 113·4 | 102·5 | 117·7 |
| 1964 ... | 112·2 | 106·4 | 127·2 | 103·2 | 101·5 | 129·3 | 116·7 | 106·6 | 115·3 |
| 1965 ... | 112·5 | 107·3 | 126·8 | 100·7 | 101·5 | 128·3 | 116·4 | 106·4 | 127·2 |
| 1966 ... | 112·3 | 109·1 | 117·0 | 95·9 | 101·5 | 127·3 | 116·8 | 105·4 | 127·6 |

සංඛ්‍යා : – සංගණන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි

1961 සිට තියුණු ලෙස වැඩි වෙමින් පවත්නා මිල පැවති කාල පරිච්ඡේදයෙන් පසුව 1965 දී සියලුම ශීර්ෂ දර්ශකයන් ස්ථාවර තත්ත්වයට පත් වූයේ, 1966 දී තව දුරටත් ශක්තිමත් විය. පිළිවෙලින් 1962 සිට 63 දක්වා, 1963 සිට 1964 දක්වා සහ 1964 සිට 1965 දක්වා සියයට 2·35, 3·13 සහ 0·27 යනුවෙන් සිදුවූ වැඩිවීම් සමග සංසන්දනය කරන කල, 1965 සිට 1966 දක්වා කාලය තුල දර්ශකයෙහි 0·18 ක සුළු පහත වැටීමක් දක්නට ලැබිණ.

ඉහත සඳහන් සංඛ්‍යා සටහනෙහි ඇති ජීවන වියදම් දර්ශකයේ බෙද දැක්වීම් තුලින් මෑත වර්ෂයන්හීදී පැවති මිල සංචලනයන් ගේ සමහර ලක්ෂණයන් පිළිබිඹු වෙයි. විවිධ භාණ්ඩ දර්ශකයන් අතර 1966 තුළ සිදුවූ වෙනස් වීම් සංසන්දනය කරන කල, මිලෙහි වැඩි වීමක් දක්නට ලැබෙන්නේ ආහාර දර්ශකයේ පමණි. අන් සියළුම උප දර්ශකයන් හි (පාලිත ගෙවල් කුලි උපයෝගි කර ගැනීමෙන් පිළියෙල කරන ලද, ගෙවල් කුලී උප දර්ශකයෙහි හැරෙන්නට) සාමාන්‍ය මිල සංචලනයන් පහතට නැඹුරු වෙමින් පැවතිණි. 1965 දී ඇති වූ මිල සංචලනයන් තුළ ද මෙම හැඩගැස්ම ප්‍රමාණාත්මක වෙනසකින් පමණක් යුතුව දක්නට ලැබුණි. 1962 තෙක් පාරිභෝගික මිල පහත හෙලන සුලු බලපෑමක් ඇති කරවමින් පැවති ආහාර ශීර්ෂයන්ගේ දර්ශක ය, ඊට පසු වර්ෂයන්හි දී වේගයෙන් ඉහළ නැග ඇත.

පාරිභෝගික ආහාර සඳහා ගෙවීමට සිදුවූ සාමාන්‍ය මිල පිළිබඳ දර්ශකයෙහි දැක්වෙන පරිදි 1965 දී 107·37, 1966 දී 109·1 දක්වා ඉහළ ගියේ, සියයට 1·7 වැඩි වීමෙක් දැක්විය. ආහාර ගණයෙහි සැළකිය යුතු වැඩිවීමක් සටහන් වී ඇත්තේ තිරිඟු පිටි, තේ, කිරි ආහාර, කරද මුංඟ, කුළු බඩු, ලූනු, අර්තාපල්, එලවළු, හරක් මස්, එළු මස් සහ කරවල යන භාණ්ඩයන් පිළිබඳවය. මිලෙහි අඩුවීමක් දක්නට ලැබුනේ අලුත් මාලු, බටර් සහ චීස් පිළිබඳවය. 1966 වර්ෂය තුළදී මිරිස්, ලූනු, කොත්තමල්ලි, කිරි ආහාර වැනි පොදු පාරිභෝගික භාණ්ඩවල කාලීන හිඟ බවක් ඇති වූයේ, ඒ හේතුකොට ගෙන විවට වෙළෙඳ පොළෙහි ඒ භාණ්ඩ සඳහා වූ මිල තියුණු ලෙස ඉහළ ගියේය. මෙම හිඟ බව ආනයන සීමා කිරීමේ ප්‍රතිඵලයක් නොවීය. ඇත්ත වශයෙන් ම මාලු නිෂ්පාදිත, කඩල සහ ධාන්‍ය, මිරිස් සහ අනෙකුත් ව්‍යංජනයන් සඳහා ගන්නා භාණ්ඩ ආනයන ප්‍රමාණයෙහි වැඩිවීමක් දක්නට ලැබිණි. 1965 තුළ සමහර අවස්ථාවන්හිදී බලවත් හිඟ බවක් දැක්වූ කිරි නිෂ්පාදිතයන් ඊට වැඩි සුළු ප්‍රමාණයකින් 1966 දී ආනයනය කරන ලද බව පෙනී ගියේ ය. මෙයින් අදහස් වන්නේ ආහාර ද්‍රව්‍යයන්ගේ බෙද හැරීම වර්ෂය තුළදී ක්‍රමික අයුරින් සිදු නොවූ බවය.

1965 ට පෙර දශකයේ දී ජීවන වියදම් දර්ශකයේ ඉහළ යෑමට ප්‍රධාන සාධකයක් වූයේ නොනවත්වා ඉහළ යමින් පැවති රෙදි පිළි මිලය. කෙසේ වුවද, 1965 දී රෙදිපිළි වල මිල ඊට පෙර වර්ෂයේ දී පැවති මිලට වඩා සුළු වශයෙන් පහත වැටීමක් දැක්විය. 1966 තුළදී දර්ශකය පහත වැටෙමින් පැවතියේ, මුළු පහත වැටීම සියයට 7·7 ක් විය. වර්ෂය තුළදී සමූප කාර තොග වෙළෙඳ සංස්ථාව විසින් තම රෙදිපිළි වල විකිණුම් මිල ඉහළ නැංවුවද, තමන්ගේ වෙළෙඳහල් මගින් සහ පුද්ගලික වෙළෙඳුන් මගින් වෙළෙඳ පොළට ගෙන ආ රෙදි පිළි ප්‍රමාණය, වෙළෙඳ පොළෙහි මිල බොහෝ සෙයින් පහත හෙළීමට ප්‍රමාණවත් වූවක් විය. නිරීක්ෂණයට භාජනය වන කාලය තුළ රෙදිපිළි සඳහා වූ ආනයන මිල ද පහත වැටිණ.

ඉන්ධන හා එළිය ගණයෙහි මිල දර්ශකය, සියයට 5·7 කින් පහත වැටුණි. මෙම පහත වැටීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ ආනයන තීරුබද්දු ඉවත් කිරිමෙන්, භූමිතෙල් මිල පහත වැටීමය. 1965 දී මෙම තීරුබද්දු ඉවත් කරන ලද නමුදු, අඩු මිලට භූමිතෙල් ලබා ගත හැකි වූයේ 1965 අවසාන භාගයේ දී වූ අතර, 1966 මුලුල්ලෙහි එය අඩු මිලකට ලබා ගත හැකි විය.

විවිධ භාණ්ඩ ගණයේ ශීර්ෂයන්ගේ සාමාන්‍ය මිල සුළු වශයෙන් පහත වැටුණද, මෙම ගණයට අඩංගු වූ ශීර්ෂයන් අතර, ගෙදර දෙර භාණ්ඩ, අධ්‍යාපනය සහ හිසකෙස් සකස් කිරීම සඳහා

වැඩි මිලක් ගෙවිය යුතුවූ අතර, බුලත්, පුවක් සහ ප්‍රවාහණය ලාභ සහිත විය. ප්‍රවාහණ වියදම් පහළ වැටීමට හේතු වූයේ බයිසිකල් ටයර් සහ ටියුබ් වල මිල වර්ෂය තුළදී තව දුරටත් පහත වැටීමයි.

### ජීවන වියදම් දර්ශකයට අඩංගු නොවූ මිල

ජීවන වියදම් දර්ශකයට අඩංගු මිලට අතිරේක වශයෙන් ගොඩනැගිලි උපකරණ, තෙල් වර්ග සහ සායම් වර්ග, ගෙදර දොර භාණ්ඩ (දුව භාණ්ඩ, මහන යන්ත්‍ර, උපකරණ, පිහන් සහ කෝප්ප යනාදිය), මෝටර් රථ අමතර කොටස් සහ පොහොර වර්ග පිළිබඳ සිල්ලර මිල මහ බැංකුව විසින් එක්රැස් කරනු ලැබේ. මෙසේ එක්රැස් කරන ලද මිල අතරෙහි පහත වැටීමක් දක්නට ලැබී ඇත්තේ තෙල් සහ සායම් වර්ග ගණයේ පමණය. පොල්, රබර් හා තේ සඳහා වූ පොහොර වර්ග පිළිබඳ මිල පිළිගත හැකි වූවක් වන අතර, ඒවායේ මිලෙහි සියයට 2 ක වැඩි වීමක් දක්නට ලැබුණි. වර්ෂය තුළදී ගොඩනැගිලි උපකරණ පිළිබඳව කාලීන හිඟකම් ඇති වූයෙන්, ඒවායේ මිල ඉතා වැඩි මට්ටමකට ඉහළ නැංගේය.

### වැටුප්

වැටුප් ප්‍රමාණ දර්ශකයන් ලබා ගත හැක්කේ රජයේ සේවයේ නියුතුවූවන් සඳහා සහ පඩි පාලක සභා යටතේ වූ, කර්මාන්තයන් හි යෙදී සිටි කම්කරුවන් සඳහාය. II (උ) 2 සංඛ්‍යා සටහනෙන් පෙනී යන්නේ 1958 සිට රජයේ සේවයේ නියුතුවූ වන්ගේ සහ පාසැල් ගුරුවරුන්ගේ වැටුප් අනුපාතිකයන් නොවෙනස්ව පැවති බවය. ජීවන වියදම් දර්ශකයේ සුළු පහත වැටීමක් නිසා, 1966 වර්ෂය තුළදී ඔවුන්ගේ මූර්ත වැටුප් අනුපාතිකයන් ඉහළ ගියේ ය.

**II (උ) 2 සංඛ්‍යා සටහන**

**රජයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශක අංක**

**(1952 — 100)**

| වර්ෂය | ලිපිකාර හා කාර්මික වෘත්තීන්හි නියුතු සේවකයින් | | සුළු සේවකයන් | | රජයේ සේවකයන් (අ) | | රජයේ පාසැල් ගුරුවරුන් | |
|---|---|---|---|---|---|---|---|---|
| | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය | වැටුප් ප්‍රමාණ දර්ශකය | මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශකය |
| 1957 ... ... | 111·2 | 108·2 | 116·0 | 112·8 | 113·8 | 110·7 | 113·9 | 110·8 |
| 1958 ... ... | 122·3 | 116·5 | 130·4 | 124·3 | 126·7 | 120·7 | 117·4 | 111·8 |
| 1959 ... ... | 122·3 | 116·3 | 130·4 | 124·0 | 126·7 | 120·4 | 117·4 | 111·6 |
| 1960 ... ... | 122·3 | 118·2 | 130·4 | 126·0 | 126·7 | 122·4 | 117·4 | 113·4 |
| 1961 ... ... | 122·3 | 116·7 | 130·4 | 124·4 | 126·7 | 120·9 | 117·4 | 112·0 |
| 1962 ... ... | 122·3 | 115·0 | 130·4 | 122·6 | 126·7 | 119·2 | 117·4 | 110·4 |
| 1963 ... ... | 122·3 | 112·4 | 130·4 | 119·9 | 126·7 | 116·5 | 117·4 | 107·9 |
| 1964 ... ... | 122·3 | 109·0 | 130·4 | 116·2 | 126·7 | 112·9 | 117·4 | 104·6 |
| 1965 ... ... | 122·3 | 108·7 | 130·4 | 115·9 | 126·7 | 112·6 | 117·4 | 104·4 |
| 1966 ... ... | 122·3 | 108·9 | 130·4 | 116·1 | 126·7 | 112·8 | 117·4 | 104·6 |

සංඛ්‍යා : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) ලිපිකාර හා කාර්මික වෘත්තීන්හි නියුතු සේවකයන් සහ සුළු සේවකයන් සඳහා වූ ඒකාබද්ධ දර්ශකය.

පඩි පාලක කර්මාන්තයන්හි නියුතු සේවකයන් ගේ අවම වැටුප් පිළිබඳ දර්ශකයන් II (උ) 3 සංඛ්‍යා සටහනෙන් දක්වේ. කර්මාන්තයන් හි නියුතු සේවකයන්ගේ දර්ශකය වර්ෂය තුළ දී වැඩි වී ඇති අතර, කෘෂිකර්මයෙහි නියුතු සේවකයන්ගේ දර්ශකය නොවෙනස්ව පැවතිණ. කෙසේ වුවද, මෙම දෙකොටසෙහිම මූර්ත වැටුප් දර්ශක ඉහළ ගොස් ඇත. පඩි පාලක සභා වලට යටත් වන වෙළෙඳ සේවයේ නියුතු සේවකයන් ද අයත් වන මූර්ත වැටුප් පිළිබඳ මුළු දර්ශකය මුදල් වැටුප්වල පහත වැටීම නොසළකා ඉහළ ගොස් ඇත.

## II (උ) 3 සංඛ්‍යා සටහන

### පඩි පාලක සභා කර්මාන්තයන් හි කම්කරුවන්ගේ අවම වැටුප් ප්‍රමාණ දර්ශක අංක.

(1952 — 100)

| වර්ෂය | කෘෂිකර්මයෙහි යෙදී සිටින කම්කරුවෝ | | කර්මාන්ත කටයුතුවල යෙදී සිටින කම්කරුවෝ | | සියලු පඩි පාලක සභා කර්මාන්තයන්හි මණ්ඩල කම්කරුවෝ (අ) | |
|---|---|---|---|---|---|---|
| | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය | අවම වැටුප් අනුපාතික දර්ශකය | මූර්ත වැටුප් අනුපාතික දර්ශකය |
| 1957 ... ... | 108·7 | 105·6 | 104·5 | 101·5 | 107·8 | 104·7 |
| 1958 ... ... | 110·2 | 105·2 | 116·1 | 110·9 | 110·8 | 105·6 |
| 1959 ... ... | 110·2 | 104·8 | 128·8 | 122·4 | 112·3 | 106·7 |
| 1960 ... ... | 110·2 | 106·5 | 128·1 | 123·8 | 111·8 | 108·0 |
| 1961 ... ... | 110·7 | 105·6 | 128·4 | 122·5 | 112·3 | 107·2 |
| 1962 ... ... | 111·9 | 105·2 | 129·5 | 121·8 | 113·7 | 106·9 |
| 1963 ... ... | 113·3 | 104·2 | 130·9 | 120·3 | 115·2 | 105·9 |
| 1964 ... ... | 116·0 | 103·5 | 132·8 | 118·4 | 117·8 | 105·0 |
| 1965 ... ... | 116·3 | 103·4 | 132·8 | 118·0 | 118·2 | 105·0 |
| 1966 ... ... | 116·3 | 103·5 | 133·2 | 118·6 | 118·1 | 105·1 |

සංඛ්‍යා : කම්කරු දෙපාර්තමේන්තුවෙන් සහ ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

(අ) කෘෂිකර්මයෙහි නියුතු කම්කරුවන්ගේ සහ කර්මාන්තයන්හි සහ වෙළෙඳ සේවයේ නියුතු කම්කරුවන්ගේ ඒකාබද්ධ දර්ශකය.